ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 නොවැම්බර් මස 18 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 නොවැම්බර්

මෑතක දී සිදු කරන ලද දේශීය බලශක්ති මිල ගණන් පහත හෙළීමේ බලපෑම පිළිබිඹු කරමින්, 2014 ඔක්තෝබර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය, පසුගිය මාසයේ දී වාර්තා වූ සියයට 3.5 සමග සැසඳීමේ දී, 2009 නොවැම්බර් මාසයෙන් පසුව වාර්තා වූ අවම අගය වන සියයට 1.6 ක් දක්වා අඩු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය ද 2014 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 4.2 සිට 2014 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.8 ක් දක්වා අඩු විය. මේ අතර, මනාව පාලනය කරන ලද ඉල්ලුම් පීඩනයෙහි බලපෑම පිළිබිඹු කරමින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන මූලික උද්ධමනය පෙර මාසයේ පැවති සියයට 3.7 සමග සැසඳීමේ දී 2014 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.6 ක් විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පාරිභෝගික භාණ්ඩ මිල ගණන් අඩුවීම, එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 11 ක් දක්වා අඩු කිරීම වැනි අයවැය යෝජනා සහ යහපත් උද්ධමන අපේක්ෂා හේතුවෙන් ඉදිරි කාලයේ දී උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රජය සහ පෞද්ගලික අංශය විසින් ලබාගත් බැංකු ණය වර්ධනය පිළිබිඹු කරමින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනය පසුගිය මාසයේ දී පැවති සියයට 12.3 සමග සැසඳීමේ දී 2014 සැප්තැම්බර් මාසයේ දී සියයට 12.8 කින් වර්ධනය විය. වසරේ පළමු මාස නවය තුළ දී බැංකු පද්ධතිය මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 87.3 කින් ඉහළ ගිය අතර, රාජ්‍ය සංස්ථාවලට ලබා දුන් ණය රුපියල් බිලියන 1.2 කින් අඩු විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 225.9 කින් ඉහළ ගියේය.

ණය වර්ධනය අඛණ්ඩව දෙවන මාසයටත් පවත්වා ගනිමින්, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2014 සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියේය. 2014

අගෝස්තු මාසයේ දී රුපියල් බිලියන 47.7 කින් වැඩි වූ පෞද්ගලික අංශය විසින් වාණිජ බැංකුවලින් ලබාගත් ණය ප්‍රමාණය, සැප්තැම්බර් මාසය තුළ දී රුපියල් බිලියන 52.3 කින් තවදුරටත් ඉහළ ගියේය. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පෙර මාසයේ පැවති සියයට 2.6 හා සැසඳීමේ දී සැප්තැම්බර් මාසයේ දී ණය වර්ධනය සියයට 4.6 ක් විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය අනුව, වසරේ පළමු කාර්තු තුන තුළදී කාර්මික සහ සේවා යන අංශ වෙත සැලකිය යුතු ණය ගලායෑමක් පිළිබිඹු විය. මේ අතර, මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල වශයෙන් හා ඉදිරි කාලයේ දී ණය වර්ධනය සඳහා ශක්තිමත් අනුබලයක් සපයමින්, ජාත්‍යන්තර රත්‍රන් මිල ගණන් පහළ යෑම හේතුවෙන් උකස් අත්තිකාරම්වල සිදු වූ පසුබෑම මගින් පෞද්ගලික අංශයේ ණය වර්ධනය කෙරෙහි ඇති කළ බලපෑම ක්‍රමිකව අඩු විය. මැදි කාලීන හා දිගු කාලීන ණය පහසුකම් සඳහා වන අනුපාතික ද ඇතුළත්ව වෙළෙඳපොළ පොලී අනුපාතික පහළ යෑම තුළින් ආර්ථිකයට ණය ගලා යෑම වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය.

විදේශීය අංශය සැලකූවිට, ප්‍රධාන වශයෙන් අපනයන ඉපැයීම්, සංචාරක, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ බැංකු අංශයට ලැබුණු අනෙකුත් විනිමය ලැබීම් ඇතුළු සමස්ත විදේශ විනිමය ගලාඒම් හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල පුළුල් වශයෙන් ස්ථාවරව පැවතුණි. ඒ අනුව, 2014 ඔක්තෝබර් අවසානය වනවිට දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.3 කට සමාන අගයක් ගනිමින් එ.ජ.ඩොලර් බිලියන 8.8 ක් ලෙස සටහන් විය.

මෙම පසුබිම තුළ, 2014 නොවැම්බර් මස 17 වැනි දින පවත්වන ලද මුදල් මණ්ඩල රැස්වීමේ දී දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව තීරණය විය. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින්, දැනට පවතින සියයට 6.50 සහ සියයට 8.00 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය. විවට වෙළෙඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නන් නිත්‍ය තැන්පතු පහසුකම් සඳහා (SDF) ප්‍රවේශ වීම මත පනවන ලද සීමා තවදුරටත් පවතින අතර විවට වෙළෙඳපොළ වෙන්දේසි අවශ්‍ය විට පැවැත්වෙනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේදී ප්‍රකාශයට පත් කරනු ඇත.

| මුදල් ප්‍රතිපත්ති තීරණය : | ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී. |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 6.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 8.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 6.00 |